**ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2016**

**----------------------------------------------**

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත අධිකාරියේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2018 පෙබරවාරි 14 දින අධිකාරියේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 117 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීමට අදාළවන භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, අධිකාරිය විසින් ඉතිරි තොග සහ රජයේ ප්‍රදාන පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි 4.56 ඡේදය ප්‍රකාරව, ආයතන විසින් සිය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී බහුලව යොදා ගන්නා මිනුම් ක්‍රමය ඓතිහාසික පිරිවැය ක්‍රමය වුවත් එය අනෙකුත් මිනුම් ක්‍රම සමග ඒකාබද්ධව පවතී. අධිකාරියේ වත්කම් සහ වගකීම් සඳහා වෙන වෙනම මිනුම් ක්‍රම හඳුනා ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2 යටතේ ඓතිහාසික පිරිවැය ක්‍රමය පමණක් පදනම් කර ගන්නා බව දක්වා තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.300,000 ක ඖෂධ වෙළඳ හා ඖෂධ ආනයන බලපත්‍ර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ ඉදිරියට ලැබුණු ආදායම ලෙස දක්වා ඇති රු.14,360,439 තුළ සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබුණු ඖෂධ නිෂ්පාදනය කිරීමේ බලපත්‍ර 04 කට අදාළ රු.12,000 ක් එම ආදායම් ගිණුමට බැර නොකර ගෙවිය යුතු අත්තිකාරම් ගිණුමට බැර කර තිබුණි.

(ඈ) අධිකාරියේ සභාපතිවරයා විසින් පරිත්‍යාග කරනලද ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර තිබුණු රු.231,246 ක්වූ ස්ථාවර වත්කම් අයිතම 09 ක්ද, වෛද්‍ය සැපයීම් අංශය විසින් පරිත්‍යාග කර තිබුණු රු.9,214 ක් වූ UPS එකක වටිනාකමද ඇතුළුව එකතුව රු.240,460 ක ස්ථාවර වත්කම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ දේපල පිරියත හා උපකරණ ක්ෂය රු.11,477 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේදී වෛද්‍ය උපකරණ ආනයන කිරීමේ බලපත්‍ර ගාස්තු ආදායම (Device import license income) වූ රු.12,624,000 ක්ද ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් වියදම් තුළ ඇතුළත් කර තිබුණු රු.63,621 ක් වූ හඳුනා නොගත් වියදම (Un-reconciled expense) ද, 2016 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් තුළ ඇතුළත් රු.14,360,439 ක අත්තිකාරම් ලැබීම් (Advance Receipts) වලට අදාල උපලේඛන විස්තරාත්මක තොරතුරු හා අත්තිකාරම් ලැබීම්වලට අදාළ කාල විශ්ලේෂණ විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 2009 මැයි 12 දිනැති අංක 1601/15 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය | (i) ගැසට් පත්‍රය ප්‍රකාරව, ඖෂධයක් ලියාපදිංචි කිරීමේ තාවකාලික සහතිකයක් නිකුත් කිරීම සඳහා සහ වර්ෂ පහකට වලංගු වන පරිදි ලියාපදිංචි සහතිකයක් අලුත් කිරීම සඳහා රු.10,000 ක් බැගින් ගාස්තු අයකල යුතු වුවද ඊට පටහැනිව නිකුත් කරන ලද එම සහතිකවලට රු.3,000 ක්, බැගින් අයකර තිබුණි. |
| | (ii) ගැසට් පත්‍රය ප්‍රකාරව, වර්ෂ පහකට වලංගුවන පරිදි පළමු වරට වෛද්‍ය උපකරණයක් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුව රු.7,500 ක් වුවද, නිකුත් කරන ලද එම සහතික 04 කට රු.5,000 බැගින් සහ එක් සහතිකයකට රු.1,000 ක් ලෙස රු.21,000 ක්ද වෛද්‍ය උපකරණයක් ලියාපදිංචි කිරීමේ තාවකාලික සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රු.2,000 ක් වුවද, නිකුත් කරන ලද එම සහතික 02 කට රු.1,000 බැගින් රු.2,000 ක්ද අයකර තිබුණි. |